PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

891.4809
RAT

# බුද්ධ සංකල්පයේ විකාසනය සහ එය සිංහල සම්භාව්‍ය ගද්‍යයේ නිරූපණය වන ආකාරය.

# The development of the "Buddha" concept and how it is reflected in the early Sinhala Classical prose works.

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය

සඳහා ඉදිරිපත් කැරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධය.

පූජ්‍ය මිණිගමුවේ රතනපාල හිමි.

GS/M Phil/94/52,
සිංහල දෙපාර්තමේන්තුව,
ශාස්ත්‍ර පීඨය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය.

554356

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY



# සාරාංශය.

තුන්වන ධර්ම සංගායනාව පවත්වන අවධිය වන විට නිකාය දහඅටකට බෙදී ගිය භික්ෂු ශාසනයේ යම් යම් මතවාදයන්ද බ්‍රාහ්මණික ඇදහිලිද ඉන්දියාව සමඟ තිබූ දේශපාලනික හා සංස්කෘතික සම්බන්ධතාද නිසා ලංකාවේද බුද්ධ සංකල්පයෙහි ඇති වූ විකාසනයට හේතු සාධක ලෙස අදාල අයුරින් පළමුවන පරිච්ඡේදයෙහි ලුහුඬින් සාකච්ඡා කර ඇත.

දෙවන පරිච්ඡේදයෙහි දැක්වෙනුයේ ප්‍රතිසංන්ධිය ලැබූ අවස්ථාවේ පටන් බුද්ධත්වයට පත් වී පිරිනිවන් පෑම දක්වා සිද්ධාර්ථ ගෞතම චරිතය සම්බන්ධ තොරතුරු පිටක ග්‍රන්ථයන්හි දැක්වෙන ආකාරයයි.

පිටක ග්‍රන්ථයන්හි දැක්වෙන බුද්ධ චරිතාපදානයට වඩා විකාසනීය අවස්ථාවක් පාලි අට්ඨකථාවන්හි පෙන්නුම් කරන ආකාරය තුන්වන පරිච්ඡේදයෙහි සාකච්ඡා කෙරේ.

මේ අධ්‍යයනයට පාදක කර ගත් සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථ වූ <u>ධර්මප්‍රදීපිකාව</u>, <u>අමාවතුර</u> හා <u>බුත්සරණ</u> යන ග්‍රන්ථයන් රචනයට අවශ්‍යතාව උදා වූ සැටිත් ඒ ග්‍රන්ථවල කර්තෘන් හා ග්‍රන්ථ රචිත කාලයත් එම ග්‍රන්ථයන්හි මූලාශ්‍රයන් සිවුවන පරිච්ඡේදයෙහි සාකච්ඡා වේ.

පස්වන පරිච්ඡේදයෙහි ප්‍රස්තුත ගද්‍ය ග්‍රන්ථයන්හි බුද්ධාපදානය නිරූපණය වන ආකාරය පෙන්වා බුද්ධ සංකල්පයේ කවර ප්‍රවර්ධනයක් එයින් පිලිබිඹු වීද යන්න සාකච්ඡා කර ඇත.

හයවන පරිච්ඡේදයෙහි ප්‍රස්තුත ග්‍රන්ථයන්හි බුදුන්ගේ රූපකාය සම්බන්ධ වූ තොරතුරු ඇසුරින් බුද්ධ සංකල්පයේ විකාසනය පැහැදිලි කර තිබේ.

සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථයන්හි බුදුන්ගේ ආධ්‍යාත්මික ගුණ විස්තර වන ආකාරයෙන් පිලිබිඹු වන්නේ 'බුද්ධ සංකල්පය' පිළිබඳ කවර විකාසනයක්ද යන්න හත්වන පරිච්ඡේදයේ සාකච්ඡා වේ.

අටවන පරිච්ඡේදයෙහි එන්නේ පරියේෂණයට අදාළ ලෙස බුදුන්ගේ දේශනා විලාසය ගැන සිංහල සම්භාව්‍ය ගද්‍යයන්හි ඇතුළත් වන කරුණුවල වැදගත් කමයි.

නවවන පරිච්ඡේදය වෙන් වී ඇත්තේ ප්‍රස්තුත ග්‍රන්ථයන්හි උපයුක්ත භාෂා රීති ඔස්සේ බුද්ධ සංකල්පයේ ප්‍රවර්ධනය සාකච්ඡා කිරීමටය.

මේ සෑම පරිච්ඡේදයකදීම මූලාශ්‍ර කරුණු අදාළ පමණින් ගෙන හැර දක්වා තිබේ.